

## 3.14 සමකෝණී /සමරූපී - රූප /ත්‍රිකෝණ හඳුනා ගැනීමට මෙන්ම ඒවායේ විශේෂ ලක්ෂණ පරීක්ෂාවට උපකරණයක් නිමවුම හා භාවිතය

(අ) පෙර දැනුම

i. සමකෝණී /සමරූපී - රූප /ත්‍රිකෝණ වල මූලික ලක්ෂණ හඳුනා ගැනීම.

(ආ) උපකරණය සහ එහි උපාංග




(ඇ) උපකරණ නිමවුමට කාර්යය පත්‍රිකාව

i. සමාන්තර රේඛා කිහිපයක් සහිත ABC ත්‍රිකෝණයක් ඇඳ ගන්න.

ii. ABC ත්‍රිකෝණයේ කෝණ තුනට සමාන වන පරිදි, PQR, JKL, XYZ ත්‍රිකෝණ විවිධ වර්ණවලින් කපාගෙන කාඩ්බෝඩ්වල අලවා නම් කර ගන්න.

iii. වෙනත් තහඩුවක ABCΔ පිටපත් කර එහි AB,BC,CA පාදවලට පිටතින් එම පාද තුනේ සීමා දිගේ ඝන කාඩ් බෝඩ් පටි අලවා ගන්න.

iv. එම කවුළුව තුළට PQR, JKL, XYZ ත්‍රිකෝණ තබන්න.(කුඩාම Δ උඩටම එන ලෙස අනුපිළිවෙළට එක මත එක වන සේ)

v. AB, BC, CAදිගේ දෙපසටම දිග මැනිය හැකි පරිදි cm / mm පරිමානය බැගින් අදින්න.

vi. AB, BC, CA මත විනිවිදක තහඩුවක් අලවා ගන්න.

(ඇ) උපකරණ භාවිතයට කාර්යය පත්‍රිකාව

i. B ශීර්ෂය මතට Q, K, Y කෝණ ගෙන එමින් B, Q, K, Y කෝණ අතර සම්බන්ධය නිරීක්ෂණය කරන්න.

ii. මේ ආකාරයට A, P, J, X කෝණ ද C, R, L, Z කෝණ ද සමපාත කරමින් කෝණ අතර සම්බන්ධතා ලබා ගන්න.

iii. මේ අනුව PQRΔ, JKLΔ, XYZΔ සමරූපී ත්‍රිකෝණ ද සමකෝණී ත්‍රිකෝණ ද නැද්ද යන්න නිගමනය කරන්න.

iv. අවශ්‍ය පරිදි A හෝ B හෝ C ශීර්ෂ දෙකට සියලුම ත්‍රිකෝණ ගෙන එමින් ඒ ඒ ත්‍රිකෝණයේ එක් එක් පාදයේ දිග විමසා බලා වගු ගත කරන්න.
අදාළ වගුව

| ත්‍රිකෝණය | කෝණවල අගය | | | පාදවල දිග | | |
|---|---|---|---|---|---|---|
| ABC Δ | | | | | | |
| PQR Δ | | | | | | |
| JKL Δ | | | | | | |
| XYZ Δ | | | | | | |

v. අනුරූප පාද යුගල අතර අනුපාත සොයා ඒ ගැන යම් නිගමනයකට පැමිණෙන්න.

vi. සමරූපී/සමකෝණී ත්‍රිකෝණවල අනුරූප පාද අතර පොදු ලක්ෂණය හඳුනා ගනිමින් ප්‍රමේයය ගොඩනගන්න.